## සීමාවාසිකත්ව පාසල්වල විදුහල්පතිවරු

## පාසලේ සීමාවාසිකත්ව වැඩසටහන සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

1. 2.3 පරිච්ඡේදයේ උපදෙස්වලට අනුව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සීමාවාසිකත්ව කමිටු හා සම්බන්ධිකරණයෙන් උපාධ්‍යායවරුන් තෝරා ගැනීම.
2. ශික්ෂණලාභීන් ට අදාළ වැඩවල නිරත වීම සඳහා, පත් කරන ලද උපාධ්‍යායවරුන්, ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිවලින් සතියකට කාලඡේද පහක් නිදහස් කිරීමට වගබලා ගැනීම හා දුෂ්කරතා ඇතොත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට දැනුම් දීම.
3. 2.4 පරිච්ඡේදයේ උපදෙස් අනුගමනය කරමින් ශික්ෂණලාභීන්ට පන්ති හා සහන වැඩ පැවරීම.
4. උපාධ්‍යායවරුන් හා සම්බන්ධීකරණය වෙමින්, ශික්ෂණලාභීන්ට පරිපාලන රාජකාරි වලට සහාය වීමේ කාර්යභාරයන් පැවරීම.
5. ශික්ෂණලාභීන් පන්ති කාමර ඉගැන්වීම් හා සීමාවාසිකත්වයට අදාළ සියලු කටයුතු වල නිරත වන බව තහවුරු කිරීම.
6. ශික්ෂණලාභීන් පිළිගෙන ගුරු මණ්ඩලයට හදුන්වාදීම හා ඔවුනට ගුරු මණ්ඩලයේ සහයෝගය ලබා දීම.
7. පාසල, එහි සංවිධාන රාමුව, සිදු වෙමින් පවතින ක්‍රියාකාරකම්, නීතිරීති හා ශික්ෂණලාභීන්ගේ වගකීම් පිළිබද ඔවුනට දැනුම් දීම.
8. ශික්ෂණලාභීන්ට පාසලේ ස්ථාවර වීමට හා සුදුසු නවාතැන් පහසුකම් සොයාගැනීමට සහාය වීම.
9. පාසලේ ගුරු මණ්ඩලයේ සාමාජිකයන් ලෙස, ශික්ෂණලාභීන්ගේ සමස්ත අධීක්ෂණය හා විනය පවත්වාගැනීම.
10. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල උපදෙස් හා මාර්ගෝපදේශවල සදහන් වන පරිදි, උපාධ්‍යායවරුන් විසින් ශික්ෂණලාභීන්ට උපදේශන හා මග පෙන්වීම ලැබෙන බවට වගබලා ගැනීම.

## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා කලාප අධ්‍යාපන කාර්යාල සමග සහයෝගයෙන් කටයුතු කරීම.

11. වර්ෂය ආරම්භයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විසින් පවත්වනු ලබන සිමාවාසිකත්වය හදුන්වාදීමේ රැස්වීමට සහභාගිවීම.
12. ගුරු අධ්‍යාපනඥයන්ගේ පාසල් චාරිකා සටහන ලබාගැනීම හා ඔහු/ඇය පැමිණෙන දින පාසලේ රැදී සිටීමට හැකිතාක් උත්සහ ගැනීම.
13. පැමිණෙන ගුරු අධ්‍යාපනඥයාට ගැටළු හා වැදගත් කරුණු ගැන දැනුම් දීම.
14. ගුරු අධ්‍යාපනඥයන් සමග නිරතුරු සංවාද පැවැත්වීමෙන් විද්‍යාපීඨ හා පාසල අතර සමීප සම්බන්ධීකරණයක් ගොඩනැගීම.

## පාසලේ සීමාවාසිකත්ව වැඩසටහනේ ගුණාත්මය පවත්වා ගැනීම

15. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විසින් උපාධ්‍යාවරුන් හා විදුහල්පතිවරුන් සඳහා සංවිදානය කෙරෙන පුහුණු වැඩමුළුවලට සහභාගී වීම.
16. ශික්ෂණලාභීන්ගේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ ව දැනුම්වත් වීම සඳහා මසකට වරක් උපාධ්‍යායවරුන් හා විෂයභාර ගුරුවරුන් හමුවීම.
17. ශික්ෂණලාභීන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් ගෙන එන දැනුම, ගුරු මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් සමග බෙදා හදා ගැනීමට තුඩු දෙන ගුරු සාකච්ඡා සංවිධානය කිරීම.

## ශික්ෂණලාභීන් අධීක්ෂණය කිරීමට හා තක්සේරු කිරීමට දායක වීම

18. විෂය සමගාමී ක්‍රියාකාරකම්, ප්‍රජාව සම්බන්ධ ක්‍රියාකාරකම් හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ශික්ෂණලාභීන් ට මග පෙන්වීම.
19. උපදෙස්වල දක්වා ඇති තක්සේරුකරණ ආකෘති ප්‍රයෝජනයට ගෙන ජාතික අධ්‍යාපන ආයතනය විසින් ප්‍රකාශිත "ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විසින් පවත්වනු ලබන ඉගැන්වීම් පිළිබද ජාතික ඩිප්ලෝමා පාඨමාලා වල ඇගයීම් පටිපාටිය" අනුව දායකත්වය තක්සේරු කිරීම.
20. ශික්ෂණලාභීන්ගේ පාඩම් නිරීක්ෂණය.
21. උපදෙස්වල දක්වා ඇති තක්සේරුකරණ ආකෘති ප්‍රයෝජනයට ගෙන, "ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විසින් පවත්වනු ලබන ඉගැන්වීම් පළිබද ජාතික ඩිප්ලෝමා පාඨමාලාවල ඇගයීම් පටිපාටියට" අනුව පන්තිකාමර ඉගැන්වීම් තක්සේරු කිරීම.
22. ශික්ෂණලාභීන් විසින් පිළියෙළ කොට ඇති වැඩමාලා පරික්ෂා කිරීම හා අනුමත කිරීම.
23. ශික්ෂණලාභීන්ගේ චර්යාව, ආකල්ප, ඇඳුම හා කාලඥ බව සම්බන්ධයෙන් මග පෙන්වීම.